# CONFLICT AND CONFLICT RESOLUTION (Part IV)

# සාමය ගොඩ නැගීම (Peace – Building)

## සාමය ගොඩනැගීම, නිර්වචන සහ ප්‍රවේශ

ගැටුම් සහ සාම අධ්‍යාපන සාහිත්‍යයේ සාමය යන්න දෙයාකාරයකට සංකල්ප ගත කර ඇත. මහාචාර්ය යොහාන් ගැල්ටුං (Johan Glatung) 1964 දී හඳුන්වා දුන් එම දෙයාකාර ක්‍රමය නම්

## නිෂේධනීය සාමය (Negative Peace)

ප්‍රචණ්ඩත්වය හා යුද්ධය නොමැති වීමෙන් ඇති වන සාමය.

ClassWork.LK

## සාධනීය සාමය (Positive Peace)

මෙය ප්‍රචණ්ඩත්වය සහ යුද්ධය නොමැති වීමෙන් ලබන සාමයට වඩා ඈතට යයි. මනුෂ්‍ය ප්‍රජාව අතර අන්‍යෝන්‍ය අවබෝධය ව්‍යාප්ත වීම, සාම අධ්‍යාපනය, අන්තර්ජාතික සහයෝගිතාව, ආරවුල් විසඳාගැනීම සාර්ථක ලෙස ගැටුම් කළමනාකරණය කිරීම, සමාජ අසාධාරණකම හා අසමානතා අහෝසි කිරීමෙන් සමාජයේ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට ඇති අවකාශ අහෝසි කිරීම යන මේවා පදනම් කොටගෙන ගොඩ නඟන ලද සාමය මෙයින් අදහස් වේ.

ClassWork.LK

මීට අමතරව 1970 දශකයේ දී බිහි වූ ''ධරණීය සාමය'' (Sustainable Peace) යන අලුත් සංකල්පයේ නිර්මාතෘවරයා වන්නේ ද මහාචාර්ය ගල්තුං ය. මෙහි වාචික අර්ථය නම් ''තම භව්‍යතා ක්ෂය වන්නේ නැතිව තමන් ම පෝෂණය කර ගනිමින් ඉදිරියට යා හැකි සහ පැවතිය හැකි සාමය'' යන්න යි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයෙ "මහලේකම්ව බූත්‍රෝස් බ්‍රතෝස්-ගාලි (Boutros Boutros- Ghali) 1992 දී ඉදිරිපත් කළ ''සාමය උදෙසා න්‍යාය පත්‍රය'' (An Agenda for Peace) යන ලේඛනයේ සඳහන් කරන ලද සාමය ගොඩනැගීම පිළිබඳ නිර්වචනය පහත සඳහන් ය.

''රටක් නැවත වරක් ගැටුමට ආපසු යාමේ අවදානම අඩු කිරීමේ ඉලක්කය ඇති ව, ගැටුම් කළමනාකරණය සඳහා ජාතික මට්ටමේ ඇති හැකි යාවන් සෑම මට්ටමින් ම ශක්තිමත් කිරීමත්, ධරණීය සාමය සහ ධරණීය සංවර්ධනය සඳහා පදනම දැමීමත් අරමුණු කරගත් පියවර ගණනාවක් ම සාමය ගොඩනැගීම යන්නට අඩංගු ය.

ClassWork.LK

සාමය ගොඩනැගීමේ උපාය මාර්ග මනා ලෙස සංයුක්ත වූ සහ රටේ සුවිශේෂ අවශ්‍යතාවලට ගැළපෙන ඒවා විය යුතුය. ඒවා ජාතික හිමිකාරිත්වයක් මත පදනම් විය යුතු ය.

මහාචාර්ය ජෝන් පෝල් ලෙඩරාක් (John Paul Lederach) ''සාමය ගොඩනැගීම'' යන සංකල්පයෙන් අවධාරණය කරන්නේ දීර්ඝ කාලයක් ප්‍රචණ්ඩ ගැටුම් පැවැති සමාජයක ධරණීය සාමයක් ගොඩනැගීමට නම් සමාජ බිම් මට්ටමෙන්, එනම් සාමාන්‍ය ජනයාගේ මට්ටමෙන්, සාමය ගොඩනැගීමේ කර්තව්‍ය සිදු විය යුතු බව ය.

පුරවැසියන්ටත්, සිවිල් සමාජ බලවේගවලටත්, රාජ්‍ය නොවන සංවිධාන වලටත් සාමය ගොඩ නැගීම සඳහා ඇති ශක්‍යතාව මහාචාර්ය ලෙඩරාක් අවධාරණය කරයි. එයට හේතුව සාමය ගොඩ නැගීමේ පදනම යනු ප්‍රජාවන් අතර ඇති වන ''අන්‍යෝන්‍ය විශ්වාසය'' පමණි.

Class Work.LK

# ප්‍රතිසන්ධානගත වීම (Reconcilition)

සාමය ගොඩනැඟීමේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන අවස්ථාවක් ලෙස 'ප්‍රතිසන්ධානගත වීම' යන ක්‍රියාවලිය සැලකේ. සංහිඳියාව ඇති කිරීම යන යෙදුම ද ඒ සඳහා යොදාගත හැකි ය. විශේෂයෙන් ම දීර්ඝකාලීන ප්‍රචණ්ඩ ගැටුම් පැවති සමාජවල සාධනීය සාමය ගොඩනැඟීමට අත්‍යවශ්‍ය යැයි සැලකෙන ප්‍රතිසන්ධානගත වීම යන්නෙහි සරල අර්ථය නම් අතීතයේ ගැටුමට සම්බන්ධ  සියලු පාර්ශව මෙන්ම ගැටුම් තුළ බෙදී සිටි ජනතාව ද සාමය ගොඩනැගුම් සඳහා ද එකතු වීම යි.

එම එකතු වීමේ ක්‍රියාවලියේ අතීතයේ පැවති පසමිතුරුකම, වෛරය සහ අන්‍යෝන්‍ය සැකය අතහැර දමා මිත්‍රත්වය, විශ්වාසය සහ අන්‍යෝන්‍ය ගෞරවය පිළිබඳව හැඟීම් මත පදනම් වූ සාධනීය සම්බන්ධතා ගොඩ නැඟීම ද එයින් අපේක්ෂා කෙරේ.

Class Work.Lk

ප්‍රතිසන්ධානගත වීම මට්ටමක් තුනකින් සිදුවීම අවශ්‍ය වේ.

## 1.මනෝ විද්‍යාත්මක ක්‍රියාමාර්ග -

ප්‍රචණ්ඩත්වයේ ගොදුරු බවට පත් වූ ජනතාවට එම වේදනාකාරී අත්දැකීම් සමග සාධනීය ලෙස ගනුදෙනු කිරීමට ඇති හැකි යාව සහ සූදානම ගොඩ නැගීම.

## 2.සමාජීය ක්‍රියාමාර්ග -

සමාජීය මට්ටමෙන් එම කාර්යය සඳහා සමාජය සූදානම් කිරීම, පිළිගැනීම වෙනුවට මිත්‍රත්වය හා සමාව දීම, වෙන් වී සිටීම වෙනුවට එකතු වීම, සහ වෛරය වෙනුවට අන්‍යෝන්‍ය සහකම්පනය ගොඩනැගීම මෙම සමාජ ක්‍රියාකාරකම්වල අරමුණු ය.

ClassWork.LK

## 3.දේශපාලන ක්‍රියාමාර්ග –

පෞද්ගලික මට්ටමින් සිදුවන මනෝවිද්‍යාත්මක මෙන්ම සමාජමය 'සුව කිරීමේ' (Healing) ක්‍රියාවලියට සමාන්තර ව 'දේශපාලන සුව කිරීමේ' ක්‍රියාවලියක් (Political Healing) ප්‍රතිසන්ධානගත වීමට ඇතුළත් ය. ගැටුමට මූල හේතු වූ, ආර්ථික දේශපාලන හා සමාජීය සාධකවලට දෙග් පාලන වශයෙන් ආමන්ත්‍රණය කිරීමේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක අවශ්‍යතාව මෙයින් අවධාරණය කෙරේ.

ClassWork.LK

සාමය ගොඩ නැඟීම පිළිබඳ දකුණු අප්‍රිකානු අත්දැකීම් මඟින් අවධාරණය කළ කරුණක් නම් ප්‍රතිසන්ධානගත වීමේ ක්‍රියාවලිය, සත්‍යය සෙවීම, යුක්තිය ලබා දීම සහ සාමය යන මේවා එකිනෙකට සම්බන්ධ දේ විය යුතු බව යි.

‘‘සත්‍යය සෙවීම’’ (Truth Seeking) යන්නෙන් අදහස් වනුයේ ගැටුම පැවති සමයේ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවලියේ දී ඇත්ත වශයෙන් සිදු වූයේ කුමක්දැයි සෑම දෙනා ම විවෘත ව දැනගෙන ඒ මත ‘‘සුව කිරීමේ ක්‍රියාවලිය’’ ගොඩනැඟීම යි.

‘‘යුක්තිය’’ (Justice) අවශ්‍ය වන්නේ ගැටුම සමයේ සෑම පාර්ශවයක් විසින් ම කරන ලද මානව අයිතිවාසිකම් උල්ලංඝනවල වින්දිතයන් වූ වැසියන්ට යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීම යි.

දකුණු අප්‍රිකාවේ 1995 දී පිහිටුවනු ලැබූ සත්‍ය සෙවීමේ හා ප්‍රතිසන්ධානගත වීමේ කොමිසම (Truth and Reconciliation Commission) මේ සම්බන්ධ ව ලෝකයේ පවත්නා සුප්‍රකට උදාහරණය යි.

ClassWork.LK

එනම් වැරදි කරුවන් සොයා දඬුවම් කිරීමේ සාම්ප්‍රදායික නෛතික ප්‍රවේශය වෙනුවටත්, ''පළිගැනීමේ යුක්ති'' (Retributive Justice) ප්‍රවේශය වෙනුවටත් ''සුව කිරීමේ යුක්ති' (Restorative Justice) ප්‍රවේශය ආදේශ කෙරේ. යුක්තිය පිළිබඳව මෙම ප්‍රතිසන්ධානගත වීමේ ප්‍රවේශයේ හරය නම්, වැරදි කරුවන්ට දඬුවම් දීම වෙනුවට මානව අයිතිවාසිකම් කඩවීම් සිදු කළ පුද්ගලයන් සහ වින්දිතයන් ද, ඔවුන් අයත් ප්‍රජාවේ සාමාජිකයන් ද, එක ම පොදු ක්‍රියාවලියක් වෙතට ගෙන්වා, සමාව ඉල්ලීම හා සමාව දීම මාධ්‍යයෙන් යුක්තිය ඉටු කිරීම යි.

ක්‍රියාව කළ පුද්ගලයන් සහ වින්දිතයින් අතර හමු වීම, සාකච්ඡාව සහ සහකම්පිත සංවාදය මේ ක්‍රියාවලියේ මාධ්‍යය යි.

ClassWork.LK

ClassWork.LK